# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 40/6—1973 ජනවාරි 3 වැනි බදාදා—1973.01.03**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත්‍ර ආඥාපනත

(420 වැනි අධිකාරය වන) ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත්‍ර ආඥාපනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර මා වෙත පැවරී ඇති බලතල අනුව මුදල් ඇමති, නානායක්කාරපතිරගේ මාටින් පෙරේරා වන මම, 1972 අංක 18 දරන විසර්ජන පනතින් ණය මාර්ගයෙන් ගැනීමට බලය පවරන ලද රුපියල් එකසිය හැටපන් කෝටියක් මෙහි පහත උපලේඛනයෙහි නියමිත මුදල, එම උපලේඛනයේ සඳහන් ක්‍රමය, නියමයන් හා කොන්දේසි අනුව ශ්‍රී ලංකාව ඇතුළත ණයට ගැනීමට මේ ආඥාවෙන් නියම කරමි.

ඇන්. ඇම්. පෙරේරා,
මුදල් ඇමති.

1973 ජනවාරි මස 3 වැනි දින,
කොළඹ දී ය.

### උපලේඛනය

1. ණයට ගත යුතු මුදල රුපියල් අට කෝටියක් විය යුතුය. තවද එය සම මිළට නිකුත් කරන අවුරුදු 10/12 ණය මුදලක් වශයෙන් ලබා ගත යුතු ය.

2. ණය මුදල ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු ඇතිකර, නිකුත් කිරීමෙන් පමණක් ලබාගත යුතු ය.

3. ණය මුදල සඳහා ගෙවිය යුතු පොළිය වර්ෂයකට සියයට 9ක් විය යුතු ය.

4. ණය මුදල සඳහා සෑම වර්ෂයකම අර්ධ වාර්ෂික පොළිය ගෙවිය යුතු දිනයන් ජනවාරි පළමුවැනිද හා ජූලි පළමුවැනිද විය යුතු ය.

5. ණය බේරීම සඳහා පිහිටුවන නිදන් අරමුදලට, වර්ෂයකට සියයට 5ක මුදලක් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් අර්ධ වාර්ෂිකව ගෙවිය යුතු ය. මේ ගෙවීම 1974 ජනවාරි පළමුවැනිද ආරම්භ විය යුතු ය.

6. ණය ලබා ගැනීම සඳහා නිකුත් කරන ලද ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු නිදහස් කිරීමේ දිනය 1985 ජනවාරි පළමුවැනිද විය යුතු ය.

එසේ වුවද 1982 දෙසැම්බර් තිස්එක්වන දිනට ඉක්බිතිවූත් හය මසකට නො අඩු කාලයකට පෙර ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයකින් ඇමතිවරයා විසින් නියම කරනු ලැබිය හැකි වූත් යම් දිනයක, ඒ ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු සම මිළට නිදහස් කිරීමට තෝරා ගැනීමේ බලය රජයට තිබිය යුතු ය.

### කාර්ය විස්තර පත

ව්‍යාපාර වස්තු සඳහා මුදල් භාර ගැනීමේ ලැයිස්තුව 1973 ජනවාරි 4 වැනි දින විවෘත කොට ණය මුදල සම්පූර්ණයෙන් දායක වූ විගසම වසා දමනු ලැබේ.

අවුරුදු 10–12 රුපියල් 8,00,00,000ක ණය මුදල

### ශ්‍රී ලංකාණ්ඩුවේ සියයට 9, 1983–85 ණය මුදල

සම මිළට නිකුත් කොට සම මිළටම ආපසු ගෙවනු ලැබේ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාණ්ඩුව වෙනුවෙන් රුපියල් 8,00,00,000ක ණය මුදලක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. එයට ගෙවනු ලබන පොළී ප්‍රමාණය සියයට 9 කි. ණය මුදල ආපසු ගෙවනු ලබන්නේ 1985 ජනවාරි පළමුවැනිද ය. නමුත්, හය මාසයක් කලින් දැනුම් දීමෙන් 1982 දෙසැම්බර් තිස්එක්වැනිදට පසුව ඕනෑම දිනයක ණය මුදල ආපසු ගෙවීමට ආණ්ඩුවට ඉඩ තිබේ. ණය ආපසු ගෙවන්නේ ද සම මිළටම ය.

**ණය ලබාගැනීමේ බලය.**—ණය මුදල ලබාගන්නේ 1972 අංක 18 දරන විසර්ජන පනතින් ලත් බලයෙන් හා (420 වැනි අධිකාරය වන) ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු හා ඇපපත් ආඥාපනතේ අඩංගු නීති යටතේ ය.

**අරමුණ.**—රජය විසින් මේ ණය මුදල ලබාගනුයේ 1972 අංක 18 දරන විසර්ජන පනතේ 2 (ආ) වගන්තිය යටතේ 1973 මුදල් වර්ෂයේ සේවාවන් සඳහා වැය කරනු පිණිස ය.

**නිකුත් කරන පිළිවෙල.**—ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු නිකුත් කිරීමෙන් ණය මුදල ලබා ගනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් ලියාපදිංචි කළ ව්‍යාපාර වස්තු පිළිබඳව බලපවත්වන කොන්දේසි අඩංගු පත්‍රිකා ලබා ගත හැකි ය.)

**ණය කොටසක මිළ.**—ණය කොටසක මිළ රුපියල් සියයට සියයකි. සම්පූර්ණ මුදල ඉල්ලුම් පත් ඉදිරිපත් කරන විට ගෙවිය යුතු ය. අඩුම කොටස රුපියල් සියයකි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් 1973 ජනවාරි 3 වැනිද සිට ණය මුදල් ලබා ගන්නා ලැයිස්තුව පියවනතුරු, රාජ්‍ය ණය ලේඛකාධිකාරී විසින් භාරගනු ලැබේ. ණයට මුදල් දීමේ ඉල්ලීම් නියමිත ඉල්ලුම් පත්‍රිකාවල එවිය යුතු අතර, ඊට ගෙවිය යුතු මුළු මුදල ඒ සමඟ එවිය යුතු ය. ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ මුදල් තැන්පත් කරන්නන්ට එම බැංකුව මාර්ගයෙන් ඉල්ලුම් පත් ඉදිරිපත් කළ හැකි ය.

බැංකුවලට ද (ජාතික ඉතිරි කිරීමේ බැංකුව ඇතුලු) පිළිගත් ව්‍යාපාර වස්තු තැරැව්කරුවන්ට ද ඔවුන්ගේ මුද්‍රාව දරන ඉල්ලුම් පත් වෙනුවෙන් භාර ගත් නාමික ණය මුදල අනුව සියයට $\frac{1}{16}$ ක් කොමිස් වශයෙන් දෙනු ලැබේ. හුවමාරු ගාස්තු වශයෙන් නීතිඥවරුන්ට තමන්ගේ මුද්‍රාව දරන ඉල්ලුම් පත්වල භාර ගත් ණය මුදල සම්බන්ධයෙන් ඒ ප්‍රමාණයේ ම කොමිස් ගෙවනු ලැබේ.

**චෙක්පත් මගින් කෙරෙන ගෙවීම.**—" ශ්‍රී ලංකාණ්ඩුවේ ණය මුදල " යනුවෙන් හරස් රේඛිත කොට මහ බැංකුව වෙත ගෙවීමට අණ කරන චෙක් පතකින් මුදල් ගෙවිය හැකි ය.

**ව්‍යාපාර වස්තු කොටස් සහතික පත්‍ර.**—ඉල්ලුම් පත් ලැබීමෙන් හා පිළිගැනීමෙන් පසු ව්‍යාපාර වස්තු කොටස් සහතික නිකුත් කරනු ලැබේ.

**පොළිය.**—සෑම වර්ෂයකම අර්ධ වාර්ෂිකව ජනවාරි 1 වැනිද හා ජූලි 1 වැනිද වසකට සියයට 9 බැගින් පොළී ගෙවනු ලැබේ. පළමුවෙන් පොළී ගෙවන්නේ 1973 ජූලි 1 වැනිද ය. ඒ පොළිය ගෙවනු ලබන්නේ ඉල්ලුම් පත් පිළිගත් දින සිට 1973 ජූනි 30 වැනිද තෙක් ඒ දිනය ද ඇතුළත් වන කාලසීමාව සඳහා ය.

අයබදු ගැනීම.—(i) මුද්දර ගාස්තු :—ණය නිකුත් කිරීම, පවරා දීම හා ආපසු ගෙවීමාදියේදී පාවිච්චි කරන සෑම ලියවිල්ලක්ම මුද්දර ගාස්තුවලින් නිදහස් ය.

(ii) ආදායම් බදු.—ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට හැර ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන්ට ආදායම් බදු අඩු නොකර පොළී ගෙවනු ලැබේ. නමුත් ආදායම් බද්දට යටත්වන ශ්‍රී ලංකාවේ පදිංචි ව්‍යාපාර වස්තු හිමියන් ආදායම් බදු සඳහා තමාගේ ආදායම් පෙන්වීමේ දී එම පොළිය ද අඩංගු කළ යුතුය. ශ්‍රී ලංකාවේ පදිංචි නොවූවන්ට හා ඒකාබද්ධ වූ හින්දු පවුල්වල සාමාජිකයින්ට පොළී ගෙවීමේ දී ආදායම් බදු අඩුකර පොළී ගෙවනු ලැබේ. ශ්‍රී ලංකාවේ ආදායම් බද්දෙන් නිදහස් අයට, අය කරනු ලැබූ ආදායම් බදු එම දෙපාර්තමේන්තුවෙන් ආපසු ලබා ගැනීමට අයිතිවාසිකම් තිබේ.

(iii) බූදල් බද්ද.—ශ්‍රී ලංකාණ්ඩුව විසින් ශ්‍රී ලංකාව ඇතුළත නිකුත් කරන ලද ව්‍යාපාර වස්තු බූදල් බදු ගෙවීම සඳහා ආණ්ඩුව විසින් භාර ගනු ලැබේ. මෙම ව්‍යාපාර වස්තුවල නාමික මිළත් එයින් රැස්වන පොළියත් ඒ සමාන බූදල් බද්දක් ගෙවීමට යෙදිය හැක. මුදලින් බූදල් බදු ගෙවීම වෙනුවට ව්‍යාපාර වස්තු මාර්ගයෙන් ගෙවීම කළ හැක්කේ එම ව්‍යාපාර වස්තු මුලින් නිකුත් කරන අවස්ථාවේදීම මියගිය තැනැත්තා විසින් මිළයට ගෙන තිබේ නම් හෝ මරණයට වසකට නො අඩු කාලයකට පෙර එම ව්‍යාපාර වස්තු මිළයට ගෙන තිබේ නම් හෝ පමණකි.

**සුරක්ෂිතතාවය.**—ණය මුදල් ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් ආරක්ෂා වී ඇත. ණය ගෙවීමේ අරමුදල්හි භාරකරුවන් වන මහ බැංකුවේ මුදල් මණ්ඩලය එහි පාලනය යටතේ ණය මුදල් බේරීම් සඳහා වෙන් වූ නිදන් අරමුදලක් පිහිටුවනු ඇත. වර්ෂයකට සියයට 5 ප්‍රමාණය අනුව 1974 ජනවාරි 1 වැනිද සිට නිදන් අරමුදලට අර්ධ වාර්ෂික ගෙවීම් පටන් ගනු ලැබේ.

**ආණ්ඩුවේ ණය මුදලේ ප්‍රමාණය.**—දැනට ශ්‍රී ලංකාණ්ඩුවේ දළ ණය ප්‍රමාණය රු. 963,88,53,368 කි. ණය බේරීම සඳහා වෙන් වූ නිදන් අරමුදලෙහි ආසන්න වෙළඳ වටිනාකම රු. 80,79,46,565 කි. එම නිසා ආණ්ඩුවේ ඉතිරි ශුද්ධ ණය මුදල රු. 883,09,06,803 කි.

**ඉල්ලුම් පත්.**—ඉල්ලුම් පත් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන්, වාණිජ බැංකු වලින්, කච්චේරිවලින්, තැපැල් කාර්‍යාලවලින් හෝ ජාතික මුදල් ඉතිරි කිරීමේ ව්‍යාපාරයේ කොමසාරිස්වරයාගේ කාර්‍යාලයෙන් ද ලබා ගත හැකි ය.

රාජ්‍ය ණය ලේඛකාධිකාරී.

කොළඹ 1,
තැ. පෙ. 1149,
ශ්‍රී ලංකා මහ බැංකුව,
රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව,
1973 ජනවාරි මස 3 දින දී ය.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී